පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක 2018/10

මගේ අංකය:- එන්සීපී/සීඑස්/පීටී/එෆ්ආර්/05/07
ප්‍රධාන ලේකම් කාර්යාලය,
උතුරු මැද පළාත.
2018.03. 12

උතුරු මැද පළාත් සභාවේ සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

<u>පළාත් සභාවට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම.</u>

මධ්‍යම රජයේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතනවල මෙන්ම පළාත් සභාවේ ආයතනික පද්ධතිය තුළ ද වාහන වල ලියාපදිංචි අයිතිය නිරවුල් නොවීම ආශ්‍රිත ගැටළු පවතින බව හඳුනාගනු ලැබ ඇත.

02. පළාත් සභාවේ වාහන පළාත් ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි කළ යුතු වන හෙයින් මෙතෙක් ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි වී නොමැති වාහනවල අයිතිය නිරවුල් කර, ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි කිරීමට පහත විධිවිධානයන් අනුගමනය කළ යුතුවේ.

i. ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟත්වය මත ප්‍රධාන ලේකම්, උතුරු මැද පළාත නමින්, ලියාපදිංචි කර ගැනීමට කටයුතු කළ යුතු වේ. ලියාපදිංචි පැවරීමට අදාළ ලියාපදිංචි අයිතිය ඇති බලධරින් එකඟ නොවන්නේ නම්, ඒ බව ලිඛිතව සනාථ කරගෙන මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

ii. ප්‍රධාන ලේකම් නමින් ලියාපදිංචි වී නැති නමුත් පරිහරණය කරන වාහනයක ලියාපදිංචි අයිතිය දැනටමත් අහෝසි වී ඇති ආයතනයක් නමින් ලියාපදිංචි වී ඇත්නම් එම ආයතනයේ කාර්යයන් පැවරී ඇති නව අමාත්‍යාංශය / ආයතනය විමසා එම වාහනය ප්‍රධාන ලේකම් නමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. ලියාපදිංචිය පැවරීමට අදාළ ආයතනයේ බලධාරින් එකඟ නොවන්නේ නම්, ඒ බව ලිපියක් ලබාගෙන මා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

iii. රජයේ ආයතනවලට පරිත්‍යාග වශයෙන් ලැබී ඇති වාහන භාවිතය සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

(අ) භාවිතය ආර්ථිකමය වශයෙන් ඵලදායී වන්නේ නම්, සහ අදාළ බදු මුදල් ගෙවීම සඳහා අවශ්‍යවන අරමුදල් සපයා ගතහැකි නම් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත අදාළ බදු මුදල් ගෙවා එම වාහනවල ලියාපදිංචි අයිතිය ලබාගැනීමට කටයුතු කළ යුතු අතර, ඒ සඳහා අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා මා වෙත ඉදිරිපත් කළ යුතුය.

(ආ) ඉහත (අ) යටතේ ලියාපදිංචි අයිතිය ලබාගැනීමට නොහැකිවන වාහන පිළිබඳ තොරතුරු අදාළ අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ නිර්දේශ සහිතව පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඉදිරි උපදෙස් ලබාගැනීමට කටයුතු කළ යුතුවේ.

එච්.එම්.පී බණ්ඩාර,
ප්‍රධාන ලේකම් ,
උතුරු මැද පළාත.

පිටපත් :-

1. විගණකාධිපති - දැ.පි.
2. අභ්‍යන්තර විගණන හා විමර්ශන අධ්‍යක්ෂ, උතුරුමැද පළාත. - දැ.පි.